දික්වැල්ල පොලීසියේ සිර මැදිරියේ කම්බි කපාගෙන පැන ගිය සැකකරුවන් දෙදෙනෙකු, ඉන් පැය ගණනකට පසු පොලිස් භාරයට ගත් සිදුවීමක් සැප්තැම්බර් 04, 2023 අරුණ පුවත්පතේ පුවත් වාර්තාවන් දෙකක් ඔස්සේ දැක්වී තිබිණි.

මෙම එකම සිදුවීම සම්බන්ධයෙන්, එකම පුවත්පතේ පුවත් වාර්තාවන් දෙකක සිරස්තල ඔස්සේ දැක් වී තිබූ ආකාරය මෙසේ පෙන්වා දිය හැක.

* "මිතුරන් ගෙනා කියත් පටියෙන් කුඩ්ඩෝ කූඩුව කපාගෙන පනී" - අරුණ

* "සිරමැදිරියේ කම්බි කපා පැන ගිය සැකකරු අල්ලයි" - අරුණ

1) "කුඩ්ඩා" වැනි ඍණාත්මක ලේබල්කරණයන් ඔස්සේ, මත් ද්‍රව්‍ය භාවිතා කරන්නන් සම්බන්ධයෙන් සමාජය තුළ ඇති ගර්හාව සහ කොන් කිරීම තවත් තීව්‍ර නොවන්නේද? ඔවුන්ට පුනරුත්ථාපනයකින් පසු හෝ සමාජය හා එක්වීමට ඉඩ ලබාදීම සඳහා, "කුඩ්ඩා" වැනි යෙදුම් භාවිතය නවතා දමා, "මත් ද්‍රව්‍ය භාවිතා කරන්නන්" හෝ "සැකකරුවන්" වැනි යෙදුම් ඔස්සේ ඔවුන්ව හැඳින්වීම වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

2) මෙම එකම සිදුවීම සම්බන්ධයෙන්, එකම පුවත්පතේ පුවත් වාර්තාවන් දෙකක, එක් වාර්තාවක "සැකකරුවන්" ලෙසින් සහ, අනිත් පුවත් වාර්තාවේ "කුඩ්ඩෝ" ලෙසින් අදාළ සැකකරුවන්ව හඳුන්වා තිබීම සම්බන්ධයෙන් ඔබගේ අදහස කුමක්ද?

